# කර්මාන්ත, ඉදිකිරීම්, වෙළඳ හා සේවා අංශය
# கைத்தொழில், நிர்மாணம், வர்த்தகம் மற்றும் சேவைகள் பிரிவு
# Industry, Construction, Trade & Services Division

දුරකථන / Telephone / தொலைபேசி - අධ්‍යක්ෂ 011 2147401, පොදු 011 2147410

ඊ - මේල් / e – mail / மின்னஞ்சல் - industries@statistics.gov.lk

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
306/71, පොල්දුව පාර, බත්තරමුල්ල.
தொகைமதிப்பு மற்றும் புள்ளிவிபரத் திணைக்களம்
306/71, பொல்துவ வீதி, பத்தரமுல்லை
Department of Census and Statistics
306/71, Polduwa Road, Battaramulla.


මගේ අංකය / எனது இல / My No. - 02/ASTS/2021

ඔබේ අංකය / உமது இல / Your No. -

දිනය / திகதி / Date - 2021/10/25

අංශ ප්‍රධානී,

සංඛ්‍යාලේඛන අංශය,

.................................. දිස්ත්‍රික්කය.

**වාර්ෂික සමීක්ෂණ 2021 (කර්මාන්ත, වෙළඳ හා සේවා)**

මෙම අංශය මගින් වාර්ෂිකව පවත්වනු ලබන ඉහත සමීක්ෂණයන්හි 2020 ලිත් වර්ෂයට හෝ 2020/21 ගිණුම් වර්ෂයට අදාලව තොරතුරු ලබා ගැනීමට අවශ්‍ය ලේඛන මේ සමඟ ලබා දෙමි. පහත දැක්වෙන උපදෙස් අනුගමනය කරමින් ක්ෂේත්‍ර කටයුතු මෙහෙයවන මෙන් කාරුණිකව දන්වමි.

**1. ඔබ වෙත එවනු ලබන ලේඛන**

i. ප්‍රා.ලේ. කොට්ඨාස මට්ටමින් සකස් කරන ලද ආයතන ලැයිස්තුව (පිටපත් 2)

එක් පිටපතක් දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශයට හා අනෙක් පිටපත අදාල කොට්ඨාස භාර නිලධාරිට ලබාදීම සඳහා

ii. එක් එක් සමීක්ෂණයට අදාලව ආවරණ ලිපි, ප්‍රශ්නාවලි හා උපදෙස් පත්‍රිකා

**2. දිස්ත්‍රික් ප්‍රධානි ගේ අවධානය යොමු විය යුතු කරුණු**

(1.)පහත දැක්වෙන කරුණු පිළිබඳ ව කොට්ඨාස භාර හා අනෙකුත් සමීක්ෂණ නිලධාරින් දැනුවත් කරන්න.

i.ක්ෂේත්‍ර කටයුතු සඳහා ලබාදී ඇත්තේ නියැදිය සඳහා වන ආයතන පමණක් වන අතර, සියළුම ආයතන ආවරණය කරන ලෙස.

ii.ආයතන ලැයිස්තුවෙහි සඳහන් යම් තොරතුරක් වෙනස් වී ඇත්නම් සමීක්ෂණයට යන පළමු දිනයේදීම ආයතන ලැයිස්තුව යාවත්කාලීන කළ යුතු බව ( ඇමුණුම 1 පරිදි)

iii.ආයතනයක තොරතුරු ඊට අදාල ප්‍රධාන කාර්යාලයෙන් ලබා ගත යුතු නම් එම ප්‍රධාන කාර්යාලයේ ලිපිනය ලබා ගත යුතු බව.

iv ප්‍රශ්නාවලියක් ආයතනයකට භාර දීමේදී අදාල යොමු අංකය සටහන් කර දීම අත්‍යවශ්‍ය බව.

v.වාර්ෂික වෙළඳ හා සේවා සමීක්ෂණ සඳහා අදාල ආවරණ ලිපියෙහි ඇති හිස් කොටුවෙහි ආර්ථික ක්‍රියාකාරකම හා SLSIC කේතය සඳහන් කළ යුතු බව.( ලබාදී ඇති ආයතන ලැයිස්තුවෙහි සඳහන් පරිදි)

vi. ආයතනවලින් සති දෙකක කාලයක් තුල තොරතුරු ලබා ගත යුතු වුව ද දැනට රට තුල පවතින තත්වය, ඔබගේ දිස්ත්‍රික්කයට හා අදාල ප්‍රා.ලේ. කොට්ඨාසවලට බලපා ඇති අන්දම අනුව ආයතනයෙන් තොරතුරු ලබාගැනීමේ දිනය සති 2- 3 ක් සේ සලකා ආවරණ ලිපියෙහි සටහන් කරන ලෙස.

vi ආර්ථික ක්‍රියාකාරම වෙනස් වී ඇත්නම් වර්තමාන ක්‍රියාකාරකමට අනුව ප්‍රශ්නාවලියක් සම්පූර්ණ කළ යුතු බව(කෘෂිකාර්මික කටයුතු අදාල නැත.)

(2). එක් ප්‍රා. ලේ. කොට්ඨාසයක ආයතන සංඛ්‍යාව 30 ට වැඩි වූ විට ඉතිරි ආයතන නියැදිය 30 ට වඩා අඩු ප්‍රා.ලේ. කොට්ඨාස භාර සං.නි./සං.ස. නිලධාරීන් හෝ මූලස්ථාන සං.නි./සං.ස. නිලධාරීන් යොදවා සම්පූර්ණ කිරීමට කටයුතු කිරීම. ඒ සම්බන්ධව එම නිලධාරීන්ට ආයතන 3 ක් සඳහා සංයුක්ත දීමනා එකක් හා ගමන් වියදම් ලබා ගත හැකිය. ආයතන 30 ට වඩා වැඩි කොට්ඨාසයක නිලධාරියෙක් වෙනත් කොට්ඨාසයකට නොයෙදවිය යුතුය. **ගෙවීම් කිරීමට ප්‍රථම, ගෙවීම් ලේඛනයක් සකස් කර, කර්මාන්ත, ඉදිකිරීම්, වෙළඳ හා සේවා අංශයේ අධ්‍යක්ෂක ගේ අනුමැතිය ලබාගත යුතුය. මේ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මා වෙත දන්වා එවන මෙන්ද කාරුණිකව දන්වමි.**

(3). ක්ෂේත්‍ර නිලධාරීන් විසින් වාර්තා කරන, ප්‍රධාන කාර්යාල මගින් තොරතුරු ලබා ගත යුතු ආයතන, යොමු අංකය හා ප්‍රධාන කාර්යාලයේ ලිපිනය සහිතව, ලිඛිතව කර්මාන්ත අංශය වෙත දැනුම් දීම.

(4.) ආයතන වෙතින් දත්ත ලබා ගැනීමේදී ක්ෂේත්‍ර නිලධාරීන් අපහසුතාවයට පත් වන අවස්ථා වාර්තා වේ නම් ඊට සෘජුවම මැදිහත් වී දත්ත ලබා ගැනීමට කටයුතු කිරීම.

(5.) කොවිඩ් 19 වසංගත තත්වයක් රට තුල පවතින මෙම අවස්ථාවේ දී නිලධාරීන්ට නිසි සෞඛ්‍ය මාර්ගෝපදේශ පිළිපදිමින් ක්ෂේත්‍ර කටයුතුවල නියැලෙන ලෙසට උපදෙස් දීම හා හැකිනම් වඩාත් ආරක්ෂිත ක්‍රමවේදයක් නිර්මාණය කර ක්ෂේත්‍ර කටයුතු මෙහෙයවීම.

(6.) සම්පූර්ණ කරන ලද ප්‍රශ්නාවලින් ප්‍රධාන කාර්යාලය වෙත යොමු කිරීමේදී ලබා දී ඇති උපදෙස් පරිදි සම්පූර්ණ කර ඇත්දැයි පරීක්ෂා කිරීම. (ආර්ථික ක්‍රියාකාරකම අනිවාර්යයෙන් සටහන් කර තිබිය යුතුය.) තවද ආයතන ලැයිස්තුව නිසි පරිදි යාවත්කාලීන කර ඇත්දැයි පරීක්ෂා කර බලා සහතික කර එවීම.

..............................

යූ. මහේෂ්වරන්,

අධ්‍යක්ෂ.

පිටපත:

1. අධ්‍යක්ෂ ජනරාල් කා.දැ.ස.
2. අතිරේක අධ්‍යක්ෂ ජනරාල්(සංඛ්‍යාන) 1 කා.දැ.ස.
3. ප්‍රධාන ගණකාධිකාරී කා.දැ.ස.

ඇමුණුම 1

**වාර්ෂික සමීක්ෂණ (කර්මාන්ත.වෙළඳ හා සේවා) 2021**

**ආයතන ලැයිස්තුව යාවත්කාලීන කිරීම සඳහා උපදෙස්**

සමීක්ෂණ කටයුතුවල යොදවන නිලධාරීන් පහත උපදෙස් අනුව දැනුවත් කරන මෙන් කාරුණිකව දන්වමි.

i. ආයතන ලැයිස්තුවෙහි සඳහන් යම් තොරතුරක් වෙනස් වී ඇත්නම් හෝ වැරදි නම් තනි ඉරකින් කපා නිවැරදි කරන්න.

ii. ආයතන ලැයිස්තුවෙහි අවසාන තීරයෙහි ආයතනයෙන් ලැබුන ප්‍රතිචාරය සටහන් කරන්න. ඒ සඳහා පහත කේත භාවිත කරන්න.

| ප්‍රතිචාරය | කේතය |
|---|---|
| සම්පූර්ණ කර ඇත. | 1 |
| අර්ධ වශයෙන් සම්පූර්ණ කර ඇත. | 2 |
| දත්ත ලබාදීම ප්‍රතික්ෂේප කරන ලදී. | 3 |
| ආයතනය වසා ඇත. | 4 |
| සොයා ගත නොහැක. | 5 |
| *ආර්ථික ක්‍රියාකාරකම වෙනස් වී ඇත. | 6 |
| ** විෂය පථයෙන් පිටත | 7 |
| ආයතනය වෙනත් ස්ථානයකට ගෙන ගොස් ඇත. | 8 |
| වෙනත් ( සඳහන් කරන්න.) | 9 |

*ආර්ථික ක්‍රියාකාරකම කර්මාන්ත, වෙළඳ හා සේවා අංශ අතර වෙනස් වී ඇත්නම්, ඊට අදාල ප්‍රශ්නාවලියක් සම්පූර්ණ කරන්න.

** ආර්ථික ක්‍රියාකාරකම කෘෂිකර්ම අංශයට අදාල නම් විෂය පථයෙන් පිටත වේ.